රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Services, Provincial Councils and Local Government**

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | **COMBINED SERVICES DIVISION**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: **www.pubad.gov.lk** / Web Site

මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/01/01(II)
ඔබේ අංකය / எனது இல / Your No:
දිනය / திகதி / Date: 2022.01.07

අමාත්‍යාංශ ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

දිස්ත්‍රික් ලේකම්වරුන්

ප්‍රාදේශීය ලේකම්වරුන්

**ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීම නිර්දේශ කිරීම සහ අදාළ ලේඛන යොමු කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් මගේ සමාංක PA/CS/POLICY/Guidelines හා 2020.08.24 දිනැති ලිපිය හා බැඳේ.

02. එම ලිපිය මගින් ලබා දී ඇති උපදෙස් අනුව ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ පත්වීම් දින සිට මාස 06ක් ඇතුළත CSC-I ආකෘති පත්‍රය ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කළ යුතු බව දන්වා ඇත.

03. 2019 වර්ෂයේ අදියර වශයෙන් බඳවා ගෙන ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන් වසරක පුහුණු කාලය සම්පූර්ණ කිරීමෙන් පසු 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරී සේවයේ ස්ථිර පත්වීම් ලිපි නිකුත් කිරීම 2021.04.01 දින සිට සිදු කෙරුණු අතර නිලධාරීන් විසින් යොමු කර ඇති ඉල්ලීම් හා රටෙහි පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ස්ථිර පත්වීම් ලද නිලධාරීන් විසින් ඒකාබද්ධ සේවා අංශය වෙත එවිය යුතු CSC-I අකෘති පත්‍රය එවීම සඳහා 2022.01.31 දින දක්වා සහන කාලයක් ලබා දෙන බව කාරුණිකව දන්වමි.

04. ඒකාබද්ධ සේවයේ නිලධරයන්ගේ පත්වීම ස්ථිර කිරීමේ කටයුතු කඩිනමින් සිදු කිරීමේ අපේක්ෂාවෙන් CSC-I ආකෘති පත්‍රය කැඳවනු ලබන බැවින් මෙතෙක් CSC-I ආකෘති පත්‍රය යොමු කර නොමැති 2020.01.01 දින සිට පත්වීම් ලද සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු ලේඛනද 2022.01.31 දිනට පෙර ලැබීමට සලස්වන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්